# පාසල් සිසුන් මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි දක්වන නැඹුරුව (ග්‍රාමීය හා නාගරික පාසල් ඇසුරින්)

**එම්. ඒ. ආර්. දිල්ශානි**[1]

**සංක්ෂේපය**

වර්තමානයේ බොහොමයක් පාසල් දරුවන් නිසි කලට ප්‍රථම පාසල් හැරයාම බහුලව දැකිය හැකිය. මීට හේතු විමසා බැලීමේදී පාසල් සිසුන් මත්ද්‍රව්‍යවලට යොමු වී ඇති බව පැහැදිලි විය. ග්‍රාමීයත්වය හා නාගරිකත්වය මත ශිෂ්‍ය ප්‍රජාවගේ මෙම ඇබ්බැහිවීම්වල විෂමතාවන් පවතීද, යන්න අධ්‍යයනය කිරීම පර්යේෂණයේ අරමුණ වේ. මේ සඳහා ගම්පහ දිස්ත්‍රික්කයේ නාගරික පාසල් දෙකක් හා ග්‍රාමීය පාසල් දෙකක් ආශ්‍රයෙන් පර්යේෂණයක් සිදු කරන ලදී. එම පාසල් වල 6-11 ශ්‍රේණිවල පිරිමි සිසුන් ගෙන් 100 ක නියැදියක් ගෙන ප්‍රශ්නාවලි ක්‍රමය හා සම්මුඛ සාකච්ඡා ක්‍රමය මඟින් දත්ත රැස් කරගෙන විශ්ලේෂණය සිදු කරන ලදී. මෙහිදී නිගමනය වූයේ, නගරයට සාපේක්ෂව ග්‍රාමීය පාසල් ශිෂ්‍යයා මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීමේ වර්ධනයක් පෙන්නුම් කරන බවයි. ඊට හේතු වශයෙන් පර්යේෂණ අධ්‍යයනයේ දී පැහැදිලි වූයේ, ග්‍රාමීය පාසල් තුළ ශිෂ්‍යයන් පාසල අවට ම පදිංචිකරුවන් වීම හේතු කොට ගෙන පාසල් කාලයෙන් පරිබාහිරව ද එකිනෙකාට නිතර මුණ ගැසීමේ අවස්ථා වැඩිකම මත ඔවුන් කල්ලි වශයෙන් මෙම ක්‍රියාවල නිරත වන බවයි. එසේම පාසල් කාලයෙන් පරිබාහිරව මුණ ගැසීමේ අවස්ථා සීමිත වීම මත නාගරික ශිෂ්‍යයා මත්ද්‍රව්‍ය කෙරෙහි ඇබ්බැහි වීමේ ප්‍රවණතාව අඩු බව පැහැදිලි විය. එසේම, මෙම ඇබ්බැහිවීම්වලට බලපාන බාහිර සාධක අධ්‍යයනය කිරිමේදී පාසල් අසල පවතින ඇතැම් කුලීරථ රියදුරන්ගේ ඇසුර පාසල් ශිෂ්‍යයන්ගේ මත්ද්‍රව්‍ය ඇබ්බැහිවීම්වලට හේතු සාධක ලෙස පෙනී ගියේය. මේ සියලු හේතු සාධකයන් මත සිදුවන අනිවාර්ය කරුණක් ලෙස පෙනී ගියේ, වත්මන් පාසල් සිසුන්ගෙන් බහුතරයක් නිසි කලට ප්‍රථම පාසල් හැර යාම හා ඒ හේතුවෙන් සමාජයට අහිතකර පුද්ගලයින් බොහොමයක් නිර්මාණය වීමයි. පර්යේෂණය සිදුකරගෙන යාමේදී, ඉදිරිපත් වූ යෝජනා අතර පාසල් ශිෂ්‍යයින් ඇසුරු කරන කරන කණ්ඩායම් හා ඔවුන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳ දෙමාපියන් දැඩි අවධානයක් යොමු කළයුතු බව ප්‍රත්‍යක්ෂ විය.

**මුඛ්‍ය පද :** ඇබ්බැහි වීම, කල්ලි ගැසීම, මත්ද්‍රව්‍ය, ශිෂ්‍යයා, ඇසුර

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, rushanthidilshani@gmail.com